www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්දියානු දේශපානඥයෝ ශ්‍රී ලංකාවේ යුද්ධය හේතු කොට ගෙන ඉල්ලා අස්වන බවට තර්ජනය කරති

**Indian politicians threaten to resign over Sri Lankan war**

**සසි කුමාර් සහ අරුන් කුමාර් විසිනි**

**2008 ඔක්තෝබර් 24**

ශ්‍රී ලංකාවේ උත්සන්න වන සිවිල් යුද්ධය, එම ගැටුම තුල දෙමල සුලුතරය මුහුන පාන ඉරනම සහ ඉන්දියානු ආන්ඩුව ශ්‍රී ලංකා හමුදාවට දෙන සහයෝගය හේතු කොට ගෙන, අසල්වැසි දකුනු ඉන්දියානු ප්‍රාන්තය වන තමිල්නාඩුව තුල පුලුල්ව පැතිරුනු වෛරයක් අවුලුවමින් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, තමිල්නාඩුවේ දේශපාලන පක්ෂ, යුද්ධයේ විරුද්ධවාදීන් ලෙස පෙනී සිටීමේ පොරයක යෙදී සිටිති. මෙම පක්ෂවලින් බොහොමයක් ම සෘජුව ම පාදක වී ඇත්තේ දෙමල ජාතිවාදී දේශපාලනය මත ය.

තමිල්නාඩුවේ මහ ඇමති එම්. කරුනානිධි ඔක්තෝබර් 14 දා යුද්ධය පිලිබඳ සර්ව පාක්ෂික සමුලුවක් කැඳවූ අතර එම සමුලුව, නව දිල්ලියේ ෆෙඩරල් ආන්ඩුවට “අනතුරු ඇඟවීමක්” නිකුත් කලේ ය. ඉන්දියානු ආන්ඩුව “සති දෙකක් ඇතුලත ශ්‍රී ලංකාවේ යුද්ධය නතර කිරීමට ඉදිරිපත්” නොවුන හොත් ජාතික පාර්ලිමේන්තුවේ සිටින ප්‍රාන්තයේ මන්ත්‍රීවරු සමූහයක් ලෙස ඉල්ලා අස්වන බවට ප්‍රධාන යෝජනාව ප්‍රකාශ කලේ ය.

“ශ්‍රී ලංකාවේ දෙමල ජනයාගේ අයිතිවාසිකම් සහතික කරන” ලෙසත් “ශ්‍රී ලංකා ආන්ඩුවට දෙන සියලු මිලිටරි සහයෝගය නතර කරන” ලෙසත් දෙවන යෝජනාවක් ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. සර්ව පාක්ෂික සමුලුව, “ශ්‍රී ලංකා නාවික හමුදාව නිරතුරුව ම තමිල්නාඩුවේ ධීවරයන් ඝාතනය කිරීම” ද හෙලා දැක තිබේ. සමස්තයක් ලෙස, තමිල්නාඩුවේ පාදක පක්ෂ 23ක් එම රැස්වීමට සහභාගි විය.

“අනතුරු ඇඟවීම” ශක්තිමත් කරනු වස්, පාලක ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් (ඩීඑම්කේ) පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 15 දෙනා ම කරුනානිධිට අනාගත දාතමින් යුක්ත ඉල්ලා අස්වීමේ ලිපි භාර දී තිබේ. ඔවුන් ඉල්ලා අස්වුව හොත්, එහි ප්‍රතිඵලය ලෙස, ඩීඑම්කේ හවුල්කරුවකු වන නව දිල්ලියේ කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත සභාගයට ලැබෙන සහයෝගයේ සැලකිය යුතු බාදනයක් සිදු වනු ඇත. රැස්වීමට සහභාගි වූ තවත් පක්ෂයක් වන පට්ටාලි මක්කල් කච්චි (පීඑම්කේ) ද මධ්‍යම ආන්ඩුවේ කොටස්කරුවෙකි.

විපාර්ශ්වික සමස්ත ඉන්දියානු අන්නා ද්‍රවිඩ මුන්නේත්‍ර කඝාගම් (ඒඅයිඒඩීඑම්කේ) ඔක්තෝබර් 14 දා රැස්වීමට සහභාගි නොවුනේ, සිය දිගුකාලීන දරුනු ප්‍රතිවාදියා වන ඩීඑම්කේ පක්ෂයට වලකැපීමේ උත්සාහයක් ලෙස ස්වකීය ස්වාධීන විරෝධතා පැවැත්වීමට ප්‍රමුඛතාව දෙමිනි.

මෙම මවාපෑම් එකකට වත් ශ්‍රී ලංකාවේ යුද්ධය වැඩ කරන ජනතාව මත ඇති කරන බලපෑම පිලිබඳ උත්සුකතාවක් සමග කිසිදු සම්බන්ධතාවක් නැත. ඒ වෙනුවට, විවිධ උද්ඝෝෂනවල එල්ලය වන්නේ, පුලුල්ව පැතිරුනු යුද විරෝධී මනෝගතිය දෙමල ජාතිවාදයේ ඇල මං ඔස්සේ අපසරනය කිරීම සහ ස්වකීය දේශපාලන පදනම ශක්තිමක් කර ගැනීම යි. සියලුම පක්ෂ ලබන මැය මස වන විට පැවැත්වීමට නියමිත ජාතික මැතිවරන දෙස ඇස ගසා ගෙන සිටිති.

දිවයිනේ උතුරේ ශ්‍රී ලංකාවේ හමුදාව ගෙන යන ආක්‍රමනික මෙහෙයුම්, දැන් බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයේ පරිපාලන මධ්‍යස්ථානය වන කිලිනොච්චිය අල්ලා ගැනීමට ආසන්නව සිටින අතර එමගින් ලක්ෂ සංඛ්‍යාත ජනයා සිය නිවාසවලින් පලවා හරිනු ලැබ ඇත. සියලු ආධාර ඒජන්සි කිලිනොච්චි හා මුලතිව් දිස්ත්‍රික්කවලින් පිටවිය යුතු යයි පසුගිය මාසයේ ශ්‍රී ලංකාවේ ආන්ඩුව අන කිරීමෙන් පසුව, බොහෝ සරනගතයන් ජීවත් වන්නේ අතිශය දරුනු කොන්දේසි යටතේ ය.

තරුන ජනයා, ශිෂ්‍යයන්, නීතිඥයන්, කලාකරුවන් සහ කම්කරුවන් සහභාගි වන යුද විරෝධී උද්ඝෝෂන ව්‍යාපාර පසුගිය සති ගනනාව තුල තමිල්නාඩුව තුල වර්ධනය වෙමින් තිබේ. පසුගිය සිකුරාදා මදුරාසි විශ්වවිද්‍යාලයේ සිසුන් සිය ගනනක් ශ්‍රී ලංකාවේ යුද සරනගතයන් පිලිබඳ සහානුමතිය ප්‍රකාශ කරනු වස් චෙන්නායිහ චෙපොක් ක්‍රීඩාංගනය අසල විරෝධතාවක් නිරත වූහ. අගහරුවාදා විශ්වවිද්‍යාල සිසුන් සිය ගනනක් යුද්ධය වහාම නතර කරන ලෙසත් අවතැන් වූ ජනයාට හදිසි සහන ලබා දෙන ලෙසත් ඉල්ලමින් විරෝධතාවක් පැවැත්වූහ.

ඉරිදා, සංවිධාන 25කට අයත් දෙමල සිනමා නලුවන්, නිෂ්පාදකයන් සහ අධ්‍යක්ෂවරු උතුරු ශ්‍රී ලංකාවට ආසන්න දකුනු තමිල්නාඩුවේ නගරයක් වන රාමේස්වර්ම්හි විරෝධතාවක් පැවැත්වූහ. ශ්‍රී ලංකාවේ ජනාධිපති මහින්ද රාජපක්ෂ "මානව හිමිකම්වලට" සහ ජාත්‍යන්තර ප්‍රඥාප්තිවලට ගරු කල යුතු යයි ඔවුන්ගේ විරෝධතා පුවරු ඉල්ලා සිටියේ ය. හින්දු පත්‍රයේ වාර්තාවකට අනුව, ශ්‍රී ලංකාවට රහසේ මිලිටරි ආධාර සැපයීම ගැන කතිකයෝ ඉන්දියානු ආන්ඩුව විවේචනය කලහ.

## ඉන්දියානු ආන්ඩුවේ ආස්ථානය

තමිල්නාඩුවේ වැඩෙන පීඩනය ඉන්දියානු හා ශ්‍රී ලංකා ආන්ඩුවලට දේශපාලන ගැටලු නිර්මානය කරයි. ඉන්දියානු අගමැති මන්මෝහන් සිංට, සමස්තයක් ලෙස මන්ත්‍රීවරු 22කින් යුක්ත ඩීඑම්කේ සහ පීඑම්කේ, වැදගත් සහාග හවුල්කරුවෝ ය. ගෝලීය ආර්ථික කලබගෑනිය රැකියා, මිල ගනන් සහ ජීවන මට්ටම් මත ඇති කරන බලපෑම අරබයා වැඩෙන මහජන අසන්තෘප්තියට ආන්ඩුව මුහුන දෙන තතු යටතේ මෙය වඩාත් එසේ ම වේ. ජාතික මැතිවරනයක් එලඹෙමින් පවතිද්දී, කොංග්‍රස් නායකත්වයෙන් යුක්ත සභාගය මේ වන විටත් ප්‍රාන්ත මැතිවරනවල දී පරාජයන් මාලාවක් අත්විඳ තිබේ.

පෙර පැවති ඉන්දියානු ආන්ඩු මෙන් ම, සිං ආන්ඩුව ද අවදානම් සහගත දේශපාලන මාවතක ගමන් කරමින් සිටී. එක අතකින්, නව දිල්ලිය උතුරු ශ්‍රී ලංකාවේ වෙනම රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ එල්ටීටීඊ ඉල්ලීමට විරුද්ධ වේ. ඒ එය ඉන්දියානු තුල බෙදුම්වාදී ව්‍යාපාරවලට දිරි දෙනු ඇතැයි යන භීතියෙනි. සිය කලාපීය ප්‍රතිවාදීන්, විශේෂයෙන් ම පකිස්ථානය සහ චීනය, කොලඹ යම් පදනමක් අත්පත් කර ගැනීම වලකනු වස්, ඉන්දියාව ශ්‍රී ලංකාවට මිලිටරි ආධාර සැපයීමෙහි ද යෙදී සිටී. එමෙන් ම, ඉන්දියානු ආන්ඩුවට තමිල්නාඩුව තුල මහජන මනෝගතිය මුලුමනින් ම නොතකා හැරීම ද කල නොහැකි ය.

තමිල්නාඩුවේ මෑතම විරෝධතාවන්ට ප්‍රතිචාර වසයෙන්, තමන්ගේ ම ඇල් මැරුනු රාජ්‍යතාන්ත්‍රික චෝදනා නිකුත් කිරීමට ඉන්දියානු ආන්ඩුවට බල කෙරී තිබේ. ශ්‍රී ලංකාවේ දෙමල යුද සරනගතයන් සම්බන්ධයෙන් ඉන්දියාවේ "උත්සුකතා" පල කරනු පිනිස, ඉන්දියාවේ ජාතික ආරක්ෂක උපදේශක එම්.කේ. නාරායනන් සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ෂිවෂන්කර් මෙනන් විසින් ශ්‍රී ලංකා මහ කොමසාරිස් මැත දී කැඳවන ලදි.

ශ්‍රී ලංකාවේ ජනාධිපති රාජපක්ෂ ගැටලුව සමනය කරගැනීමේ ප්‍රයත්නයක් ලෙස ඉන්දියානු අගමැති සිංට දුරකතනයෙන් කතා කලේ ය. "දෙමල ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ සුභසාධනය . . . එල්ටීටීඊයට එරෙහිව දැන් සිදු වන යුද ගැටුම් සමග පටලවා නොගත යුතු" බවට සිං ප්‍රකාශ කර ඇතැයි ප්‍රවෘත්ති නිවේදනයක් සඳහන් කලේ ය. එක්සත් ශ්‍රී ලංකාවක රාමුව ඇතුලත යුද්ධයට දේශපාලන විසඳුමක් දෙසට පියවර ගන්නා ලෙස ඔහු ජනාධිපතිගෙන් යලිත් වරක් ඉල්ලා සිටියේ ය.

සිංගේ ප්‍රකාශ මුලුමනින් ම වංචාසහගත ය. 2006 මැද සිට රට යුද්ධයට යලි ඇද දැමීමේ දී, රාජපක්ෂ ආන්ඩුවට එක්සත් ජනපදයේ, යුරෝපා සංගමයේ, ඉන්දියාවේ සහ චීනයේ නිහඬ සහයෝගය ලැබී ඇත. ඉන්දියාව ශ්‍රී ලංකාවේ මිලිටරියට පුහුනුව, ඔත්තු තොරතුරු සහ උපකරන විවෘතව ම සම්පාදනය කරයි. තමිල්නාඩුවේ මහජන මනෝගතිය අස්වැසීමේ ප්‍රයත්නයක් ලෙස, නව දිල්ලිය අවධාරනය කරන්නේ, තමන් "මාරාන්තික නොවන උපකරන" පමනක් සපයන බව යි.

එල්ටීටීඊය ශ්‍රී ලංකා මිලිටරි කඳවුරකට පහර දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙනුවෙන් නව රාඩාර් පද්ධති ක්‍රියාකරවීමේ යෙදී සිටි ඉන්දියානු තාක්ෂන ශිල්පීන් දෙදෙනෙකු තුවාල ලැබූ කල, ඉන්දියාවේ "මාරාන්තික නොවන" ආධාරවල ස්වභාවය එලිදරව් විය. එල්ටීටීඊ සැපයුම් නෞකා ගනනාවක් හඳුනාගෙන ඒවා ගිල්වා දැමීමේ හැකියාව ශ්‍රී ලංකා නාවික හමුදාවට ලබා දෙමින්, ඉන්දියාව ඔවුනට මූලික ඔත්තු තොරතුරු ද සපයා ඇත. ශ්‍රී ලංකා ජනාධිපතිගේ සොහොයුරකු සහ ප්‍රධාන උපදේශක වන බැසිල් රාජපක්ෂ මෙසේ පැවසුවේ යයි කොලඹ පාදක සන්ඩේ ඔබ්සවර් පත්‍රයේ ඔක්තෝබර් 13 දා කලාපය වාර්තා කලේ ය: "අපගේ අසල්වැසියාගෙන් ලැබෙන සහයෝගය ඉතාම අගනේ ය. ඉන්දියාව සෑම විටම සිටියේ අප සමග ය. අපට එල්ටීටීඊය තලා දමන්න ඉන්දියාවෙන් උපරිම සහාය ලැබී ඇත."

"එහි සිටින දෙමල සුලුතරයන්ගේ දුක් වේදනා තුරන් කරනු පිනිස" ශ්‍රී ලංකාව තුල ඉන්දියානු මැදිහත්වීමක් සිදු කරන ලෙස තමිල්නාඩු මහ ඇමති කරුනානිධි පසුගිය සිකුරාදා කල ඉල්ලීම ඇහුම්කන් දීමේ අභිප්‍රායක් ඉන්දියානු ආන්ඩුවට නැත. ඉන්දු-ලංකා ගිවිසුම යටතේ ඊනියා සාම සාධකයන් ලෙස 1987 දී උතුරු ශ්‍රී ලංකාවට ඉන්දියානු හමුදා එවීම ගැන සඳහන් නොකිරීමට කරුනානිධි වගබලා ගත්තේ ය. එම මැදිහත්වීම ව්‍යසනයක් බවට පත්වූයේ, ඉන්දියානු හමුදාව එල්ටීටීඊය සමග ගැටී අවසානයේ ජීවිත හානි 1,200ක් ද සමග ඉවත්ව යාමට බල කෙරෙමිනි. ඩීඑම්කේ ඇතුලු සියලු තමිල්නාඩු දේශපාලන පක්ෂ එම ගිවිසුමට සහයෝගය දුන්හ.

ශ්‍රී ලංකාව තුල, වාර්ගික ආතතීන් තව දුරටත් අවුලුවනු පිනිස තමිල්නාඩුවේ විරෝධතා ඩැහැගෙන තිබේ. තමිල්නාඩු දේශපාලන පක්ෂ ශ්‍රී ලංකාවේ යුද්ධයට එරෙහිව යෝජනා සම්මත කල විට, ජනාධිපතිගේ

තවත් සොහොයුරකු වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ, එම විරෝධතා සංවිධාන කලේ එල්ටීටීඊය බවට වහා ම චෝදනා කලේ ය.

සිංහල ස්වෝත්තමවාදයේ ගිලී සිටින විපාර්ශ්වික ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ), සිය ඉන්දියානු විරෝධී ප්‍රචාරය උත්සන්න කර තිබේ. යුද්ධය අවසන් කරන ලෙස ඉන්දියාව කරන බලපෑමට රාජපක්ෂ ආන්ඩුව අවසානයේ යටත් වනු ඇතැයි ජවිපෙ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා මෑතදී අනතුරු ඇඟවී ය. නව දිල්ලිය ශ්‍රී ලංකාවට මැදිහත්වීම පිනිස තමිල්නාඩුව යොදා ගන්නා බව ඔහු ප්‍රකාශ කලේ ය.

මිලිටරිමය වසයෙන් කොටු කරනු ලැබ සිටින එල්ටීටීඊය, නව දිල්ලියට තමන්ගේ ම ඉල්ලීම් ඉදිරිපත් කරනු වස් තමිල්නාඩුවේ විරෝධතා ඩැහැගත්තේ ය. එහි දේශපාලන අංශයේ නායක පී. නඩේසන් මදුරාසි පුවත්පතකට මෙසේ පැවසී යඃ "ඉන්දියාව දෙමල ජනතාවගේ එකම නියෝජිතයා වන එල්ටීටීඊයේ තහනම ඉවත් කොට අපගේ විමුක්ති අරගලය පිලිගනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. . . . සිංහල ජාතියට උදව් කරනවා වෙනුවට දෙමල නිජභූමියට උදව් කිරීම තථ්‍ය වසයෙන් ම ඉන්දියාවට වඩා ආරක්ෂාදායකයි."

භාවිතා කර ඇති පද ම එල්ටීටීඊයේ වාර්ගික දෘෂ්ටිය එලිදරව් කරයි. යුද්ධයට වගකිව යුත්තේ සිංහල වැඩ කරන ජනතාව නොව, කම්කරු පන්තිය භේද කරනු වස් වර්ගෝත්තමවාදය අවුලුවා ඇති අනුප්‍රාප්තික කොලඹ ආන්ඩු ය. නව දිල්ලිය වෙත යොමු කරන එල්ටීටීඊයේ ආයාචනය, ශ්‍රී ලංකාවේ දෙමල ජනයා සඳහා වෙනම ධනපති රාජ්‍ය කැබැලිත්තක් තහවුරු කරනු වස් මහ බලවතුන්ගේ සහයෝගය ලබා ගැනීමේ එහි දිගු කාලීන ඉදිරිදර්ශනය ම ඉදිරියට ගෙනයාමකි.

සිය වස් කාර්තුවක සිවිල් යුද්ධයක් මගින් යලි යලිත් පෙන්නුම් කරනු ලැබ ඇත්තේ, වාර්ගික ගැටුම අවසන් කිරීමෙහි ලා, ශ්‍රී ලංකාවේ හෝ අසල්වැසි ඉන්දියාවේ ධනපති පන්තියේ මොන යම් හෝ කොටසක් දක්වන නොහැකියාව යි. යෝජනා කෙරී ඇති "විසඳුම්" සියල්ලෙ ම එල්ලය වන්නේ, කම්කරු පන්තියේ -- දෙමල හා සිංහල එක සේ -- වියදමින්, ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවේ ඒ හෝ මේ ස්ථරයේ අවශ්‍යතා සන්තර්පනය කිරීම යි.

© www.wsws.org